**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව - 2021**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධවපරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

---------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම්ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

------------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

----------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත උපකරණ අයිතමයන්හි ඵලදායී ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත් දැනට භාවිතා කරනු ලබන පිරිවැය රු. 4,463,964 ක් වූ වාහන 02 ක් ඓතිහාසික පිරිවැයට ගිණුම්වල දක්වා තිබුණු අතර වත්කම්වල ජීව කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගැනිමට කටයුතු කරන බව. | සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගයට ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුයි. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේ දී වර්ෂය තුල ගෙවා නොමැති රු.10,724,585ක් වූ ආදායම් බදු වියදම වර්ෂයේ ගෙවීම් ලෙස සටහන් කර තිබුණ අතර වෙළඳ හා වෙනත් ලැබීම් වැඩි වීම රු.20,202,989ක් වුවත් රු.5,727,328ක් ලෙස දක්වා තිබුණි. | මෙම වැරදි නිවැරදි කර 2022 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කරන බව. | පිළිතුර අනුව ක්‍රියා කළ යුතුයි. |
| (ආ) | රු.33,779,005ක් වන මුළු ණයගැති ශේෂයෙන් රු.1,688,950ක අඩමාන ණය වෙන් කිරීමක් පමණක් සිදුකර තිබුණද රු.25,925,739ක හඳුනාගත නොහැකි ණයගැති ශේෂයෙන් සඳහා කිසිදු වෙන් කිරීමක් කර නොතිබුණි. | ණයගැතියන් වෙත ශේෂය තහවුරු කර ගැනිම සඳහා ලිපි යවා තිබුණද ඒ සඳහා නැවත පිළිතුරු ලිපි එවා නොමැති බව හා මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය ලබා ගැනිම සඳහා කටයුතු කරමින් පවතින බව. | අයකර ගැනීම අවිනිශ්චිත ශේෂයන් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීමක් කළ යුතුයි. |
| (ඇ) | රු.238,256ක් වූ අවසන් තොගය සහ රු.807,440,987ක් වූ දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. සණ මීටර් 25,750ක් වූ හුණුගල් තොගයෙහි වටිනාකම ගණනය කොට මූල්‍ය ප්‍රකාශ වලට දක්වා නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | මෙවැනි සමීක්ෂණයක් සිදු කිරීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වන අතර එවැනි මූල්‍ය පිරිවැයක් දැරිමට ප්‍රමාණවත් මුදලක් සංස්ථාව සතු නොවන බව. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ඈ) | සංස්ථාවේ දේපල පිරියත හා උපකරණ තුල ඇතුලත් වත්කම් වර්ග 3කට අදාලව ගිණුම්ගත කර ඇති එකතු වටිනාකම් රු.10,113,706ක් වුවද ස්ථාවර වත්කම් ලේඛනය අනුව එම වත්කම් වල එකතු වටිනාකම රු.6,518,682ක් වීමෙන් රු.3,595,024ක වෙනසක් පැවතුණි. | වෙනසට හේතුව තොරතුරු සොයා ගත නොහැකි වත්කම් වල වටිනාකම බව. | වත්කම් ලේඛනය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 ඒකාබද්ධ කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව විසින් ලංකා සිමෙන්ති සමාගමේ රු.1,083,618,910 ක් ආයෝජනය කර තිබුණි. ඒ අනුව සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන ලංකා සිමෙන්ති සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 62.45 ක් සංස්ථාව සතු වුවද, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | ලංකා සිමෙන්ති සමාගම විසින් 2016 වර්ෂයෙන් පසු සංස්ථාවට ගිණුම් ලබා දී නැති බව හා ඇවර කිරීමේ කටයුතු සම්බන්ධයෙන් කර්මාන්ත අමාත්‍යාංශය විසින් අප වෙත 2022.05.26 දිනැති ලිපි අංක MI/RST/09/06/05 දරණ ලිපිය මගින් දැනුවත් කිරීම සිදුකර ඇති බව. | ගිණුම් ප්‍රමිත ප්‍රකාරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ණයගැතියෝ | 7,853,266 | ශේෂ සනාථ | ශේෂය තහවුරු කර ගැනිම සඳහා ලිපි යවා තිබුණද ඒ සඳහා නැවත පිළිතුරු ලිපි එවා නොමැති බව. | ශේෂ සනාථ ලබාගත යුතුයි. |
| ගෙවිය යුතු ශේෂ | 24,518,240 | ශේෂ සනාථ | ශේෂයන්ගෙන් වෙන් වෙන්ව හඳුනාගත නොහැකි ශේෂ විශාල ප්‍රමාණයක් ඇති බව හා හඳුනාගත හැකි ශේෂයන් කොටස් වශයෙන් පියවීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු වියදම් වල නිරවද්‍යතාව සොයා බලා ගෙවා පියවීමට කටයුතු කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ණය පදනම මත සිමෙන්ති විකිණීම හේතුවෙන් ණය මුදල් ආපසු නොගෙවීම හා සංස්ථාවට සිදු වූ අලාභ ගෙවීම පැහැර හැරීම හේතුවෙන් 2003, 2011, හා 2015 | ණයගැති ශේෂ නිරවුල් කර ගැනීම සම්බන්ධයෙන් ගිණුම් අංශයට උපදෙස් ලබාදී ඇතත් කිසිදු පියවර ගෙන නොමැති | ණයගැති ශේෂ නිරවුල් කර ගැනීම කර ගැනීමට කටයුතු කළ යුතුයි. |

| | |
|---|---|
| වසර වලදී බාහිර පාර්ශවයන් වෙත පවරා තිබූ නඩු 12කට අදාලව රු.14,316,638ක ශේෂ නිරවුල් කර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බව. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මු.රෙ 371 (2) | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබා දීමට ගණන් දීමේ නිලධාරියෙකුට හැකි වුවද සංස්ථාවේ ගණන් දීමේ නිලධාරියා විසින්ම රු.660,000ක තත්කාර්යය අතුරු අග්‍රිම අවස්ථා 8 කදී ලබාගෙන තිබුණි. | කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලා පරිශ්‍රයෙහි ප්‍රයෝජනයට ගත නොහැකි ද්‍රව්‍ය ඉවත් කර පිරිසිදු කිරීම සඳහා විටින් විට කන්කසන්තුරේ බලා ගමන් කිරීමට අවශ්‍ය වියදම් සඳහා මෙම මුදල් ලබාගෙන ඇති බව. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි වලට අනුකූලව අත්තිකාරම් මුදල් ලබාදිය යුතුයි. |
| (ආ) | මුදල් රෙගුලාසි 135 | ගණන්දීමේ නිලධාරියා විසින් තමාගේ කාර්යය පොදුවේ හෝ එක් එක් ගණුදෙනු සම්බන්ධයෙන් සංස්ථාවේ සංවිධාන ව්‍යුහය අනුව බලතල පැවරීමක් සිදුකළ යුතු වේ. නමුත් සංස්ථාව විසින් 2021 වර්ෂය සඳහා බලතල පැවරීමක් සිදුකර නොතිබුණි. | බලතල පැවරීමක් කිරීමට ප්‍රමාණවත් තනතුරු දරන සේවකයින් නොමැති බව. | දැනට සිටින නිලධාරින් සඳහා බලතල පැවරීමක් සිදු කළ යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 44,642,491 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 40,718,566 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3.923.925 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට බදු කුලී ආදායම් වැඩිවීම හා මූල්‍ය වියදම් අඩුවීම . ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ දී බදු පෙර සමස්ත අතිරික්තය රු.44,642,491ක් ලබාගෙන තිබුණි. එසේම වර්ෂයේදී රු 58,000,000ක මුදලක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බදු වශයෙන් රු.6,709,944ක් ගෙවිය යුතු වුවත් 2022 අප්‍රේල් දක්වා එම ආදායම් බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | බදු මුදල් 2022 ජූනි මාසය තුල ගෙවා නිම කිරීමට කටයුතු කරන බව. | නියමිත කාලයන් තුල බදු මුදල් ගෙවිය යුතුයි. |
| (ආ) | සංස්ථාවට අයත් කන්කසන්තුරේ පිහිටි තෙල් ටැංකි දෙක හා නළ පද්ධති ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත රාජ්‍ය සමාගම වෙත ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව ලබා දී තිබූ බැවින් 2010 සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා මේ සඳහා බදු කුලී ආදායම වූ රු.184,680,000ක මුදලක් අයකර ගැනීමට මේ දක්වා සංස්ථාවට නොහැකි වී ඇත. | මෙම ගැටළුව නිරාකරණය කර ගැනිම සඳහා කටයුතු කරමින් පවතින අතර රට තුළ පවතින වර්තමාන තත්ත්වය මත මෙම මුදල් ඉල්ලීම ප්‍රායෝගිකව මෙම අවස්ථාවේදී කළ නොහැකි තත්ත්වයක් උදාවී ඇති බව. | මෙම හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | සංස්ථාව හා පුත්තලම සිමෙන්ති කම්පැනි ලිමිටඩ් හෙවත් වර්තමාන සියැම් සිටි සිමෙන්ති ලංකා ලිමිටඩ් අතර 1996 අගෝස්තු 23 දින අත්සන් කරන ලද අංක 495 දරන ගිවිසුම මඟින් අරුවක්කාලු හුණුගල් සහිත ඉඩම වාර්ෂික ස්ථාවර බදු කුලී පදනම මත වසර 50කට බදු දීමට ගිවිසුම් ගතව තිබූ අතර 2019 නොවැම්බර් 07 දින අත්සන් කළ අංක 268 දරණ | මේ පිළිබඳ රේඛීය අමාත්‍යාංශය දැනුවත් කිරීමෙන් පසුව සිදුවී ඇති මුදල් අක්‍රමිකතාවය පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්කතුව වෙත පැමිණිලි කොට එම පැමිණිල්ල විමර්ශනය වෙමින් පවතින බවත් විමර්ශන ප්‍රමාදය පිළිබඳ පොලිස්පති හමු වූ බව. | ගිවිසුම් අත්සන් කිරීමට පෙර නීතිපති සහ රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් ලබාගත යුතු අතර, අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ගිවිසුම් අත්සන් කළ යුතුව තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | අතිරේක බදු ගිවිසුම මඟින් සියයට දොළහක බදු කුලිය වැඩිවීමේ ප්‍රතිශතය මත 2019 වර්ෂයේ සිට බදු කුලී ආදායම ඇමරිකන් ඩොලර් 319,118ක් ලෙස වැඩි කර තිබුණි. නමුත් 1993 සිට 2018 දක්වා පළමු ගිවිසුමෙන් අහිමි වූ වාර්ෂික බදු කුලිය ලබා ගැනීම පිළිබඳ තීරණයකට එළඹීමට මේ දක්වා සංස්ථාවට නොහැකි වී ඇති අතර අතිරේක බදු ගිවිසුම සඳහා නීතිපතිවරයාගේ අනුමැතිය මෙම වාර්තාවේ දින වන විටත් ලබාදී නොතිබුණි. | | |
| (ඈ) | රු.1,200,000ක් වටිනාකමැති ගාල්ල උණවටුන කැස්බෑපාන ඉඩම හබරාදූව, සුනාමියෙන් හානි වූ නිවාස හැටක ඉදිකිරීම් සඳහා හබරාදූව ප්‍රාදේශීය ලේකම් විසින් අත්පත් කරගෙන තිබූ අතර ඒ සම්බන්ධ කිසිදු මුදලක් ලබා ගැනීමට මේ දක්වා සංස්ථාවට නොහැකි වී තිබුණි. | 2021 මාර්තු මාසයේදී සංස්ථාවේ නීතිඥ වෙත පෙරකලාසිය යොමු කර වන්දි ලබාගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | සංස්ථාවට ලැබිය යුතු වන්දි ලබා ගැනීමට අප්‍රමාදව ක්‍රියා කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------- | ------------- |
| (අ) | 1957 අංක 49 දරණ කාර්මික සංස්ථා පනත මඟින් පිහිටුවා ඇති ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ දැක්ම ශ්‍රී ලංකාවේ සිමෙන්ති කර්මාන්තයේ දියුණුව සඳහා මඟ පෙන්වීම සහ නායකත්වය ලබාදීම වන අතර මෙහෙවර වශයෙන් රටේ අවශ්‍යතා සපුරාලීම සඳහා ගුණාත්මක සිමෙන්ති සහ අනෙකුත් සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණවත් ලෙස සැපයීම සහතික කිරීම වේ. නමුත් වර්තමානය වන විට සංස්ථාව විසින් සිමෙන්ති හෝ සිමෙන්ති ආශ්‍රිත කිසිදු | ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව කර්මාන්ත ශාලා 03 පැවතිය අතර 1993 වර්ෂයේදි රුහුණු හා පුත්තලම සිමෙන්ති කර්මාන්තශාලා පුද්ගලීකරණය කර, කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව 1990 වර්ෂයේදී එවකට පැවති යුධමය තත්ත්වය හේතුවෙන් සම්පූර්ණයන්ම අකර්මන්‍ය වූ බවද, වරින් වර සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන කටයුතු හා සිමෙන්ති ආනයනය කර විකිණීමේ කටයුතු වලින්ද අලාභ ලැබීම සිදු වූ බව, හා සිමෙන්ති කර්මාන්තයේ | සංස්ථාව පිහිටුවීමේ මූලික අරමුණු ඉටුවෙන ආකාරයට මෙන්ම සංස්ථාව සතු ස්වාභාවික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හැකිවන පරිදි කටයුතු කළ යුතුයි. |

නිෂ්පාදනයක් සිදුකරනු නොලබයි. සංස්ථාවේ ආදායම් මාර්ග සංස්ථාව සතු අක්කර 5,164ක් වූ අරුවක්කාලු හුණු ගල් නිධිය බදුදීම, පලාවි පිහිටි අක්කර 12ක් රූඩ් 3 පර්චස් 30ක් වූ ඉඩම බදුදීම හා කොල්ලුපිටිය පිහිටි පර්චස් 89.07ක් වූ ඉඩම රථගාලක් පවත්වාගෙන යාමෙන් ආදායම් ඉපයීම පමණක් වේ. 2021 වර්ෂයේ එම ආදායම රු.65,256,215ක් වී තිබුණි. නමුත් සංස්ථාවට අනුයුක්ත නිලධාරීන් 13 දෙනෙකු සඳහා ඉහත කාර්යය ඉටු කිරීම වෙනුවෙන් වැටුප් හා දීමනා ඇතුළුව පරිපාලන වියදම් වශයෙන් රු.19,983,648ක වියදමක් වාර්ෂිකව වැය කරනු ලබයි. එම වියදම මුළු බදු කුලී ආදායමෙන් සියයට 31ක් පමණ වී තිබුණි.

දියුණුව සඳහා ඇසුරුම් කර්මාන්ත ශාලාවක් නැවත ස්ථාපනය කිරිම සඳහා අවශ්‍ය වැඩ කටයුතු නව කළමණාකාරිත්වය යටතේ සිදු කිරිම ආරම්භ කළ අතර ඒ සඳහා වාර්තාවන්ද සකස් කර ඇත. මූලික ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවීම නිසා මෙන්ම ලෝක වෙළඳපල තුල සිමෙන්ති මිල ඉහළ යාම, නැව් ගාස්තු වැඩිවිම, ශීඝ්‍රයෙන් රුපියල අව ප්‍රමාණය වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාමෙන් සංස්ථාවට අලාභයක් සිදුවිය හැකිය යන කරුණ සැළකිල්ලට ගෙන නැවත ඇරඹීමට අපේක්ෂිතව තාවකාලිකව නවතා ඇති බව.

(ආ) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු වූ පර්චස් 89.07ක් වු කොල්ලුපිටිය ඉඩම 2008 වර්ෂයේ දී ලංකා බැංකුවට උකස් කර ලබාගෙන තිබූ ණය මුදල 2017 වර්ෂයේ දී රු.97,700,000කට ප්‍රතිව්‍යුහගත කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට තවදුරටත් ගෙවිය යුතු ණය ශේෂය රු.58,700,000ක් වේ. ලබාගත් මෙම ණය මුදල වෙනුවෙන් 2021 වර්ෂයේ රු.5,511,774 ක පොලී මුදලක් ගෙවා ඇතත්, එකී ඉඩම බදු දීමෙන් වර්ෂයේ ලද කුලී ආදායම රු.4,893,331 පමණක් වී තිබුණි. රු.මිලියන 735ක් පමණ වටිනා ඉතාමත් ඉහළ වාණිජමය වටිනාකමකින් යුත් මෙම ඉඩම, 2021 සැප්තැම්බර් 29 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මිශ්‍ර ආයෝජන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා වූ ප්‍රසම්පාදන

මෙම ඉඩම ඉහල වාණිජ වටිනාකමින් යුත් ඉඩමක් වන අතර මිශ්‍ර ආයෝජන ඵලදායි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිම නාගරික සංවර්ධන අධිකාරි පනතේ අනුමැතිය සහිතව කළ යුතු අතර සුදුසු ආයෝජකයකු සොයාගැනිම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතිව බව හා .සුදුසු ආයෝජකයකු සොයා ගන්නා තෙක් භූමිය පිරිසිදුව තබා ගැනිම මහ නගර සභා ආඥා පණතේ රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව සිදුකළ යුතුව ඇති බැවින් මාස 03ක කෙටි කාල සිමාවකට විවිධ ආයතන සඳහා තාවකාලිකව රථ වාහන ගාල් කිරිමට අවසර ලබා දි ඇති අතර එමගින් සංස්ථාවට ආදායමක්ද ලැබෙමින් පවතින බව. තාවකාලිකව රථගාල් කිරිම සඳහා ලබාදීමෙන් උපයන අදායම සමග බැංකු

සංස්ථාව සතු දේපළ ඵලදායි ආයෝජනයන් සඳහා යොදා ගත යුතුයි.

| | | | |
|---|---|---|---|
| | කටයුතු මෙම වාර්තාවේ දින වන විටත් කිරීම අවසන් කර නොතිබුණි. ඒ අනුව මෙම දේපළ ඵලදායී ආයෝජනයක් සඳහා යොදා ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. | ණය පොළිය සැසඳීම මගින් ප්‍රමාණවත් තොරතුරක් ලබාගත නොහැකි බව. | |
| (ඇ) | ඉහළ වටිනාකමක් සහිත බර ඛනිජ ද්‍රව්‍ය සහිත අරුවක්කාලු හුණුගල් නිධිය සහිත ඉඩමේ ඉහළ පස් තට්ටුව හා කැණීම් කිරීම සඳහා ලංකා ඛනිජ වැලි සමාගම සමඟ ඒකාබද්ධ ව්‍යාපෘතියක් 2021 සිට 2025 කාල සීමාව තුළ ආරම්භ කිරීමටත්, ඒ සඳහා අදාල පාර්ශව සමඟ ගිවිසුම් සකස් කිරීම 2020 ජුනි සිට 2021 දෙසැම්බර් දක්වා වූ වසර 1½ක කාලයක් තුල සිදු කිරීමට සැලසුම් කර තිබුණ ද, මෙම වාර්තාවේ දින දක්වාම එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. | පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ 2022.02.07 ලිපියේ ලංකා ඛණිජ වැලි සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරයා අරුවක්කාලුහි පිහිටි ඛණිජ වැලි සහිත භූමිය තවදුරටත් අවශ්‍ය නොවන බව දන්වා ඇති බව සඳහන් කර ඇති නමුත් ඒ පිළිබඳව සංස්ථාව වෙත දැන්වීමක් කර නොමැති බව. | සංස්ථාව සතු ස්වාභාවික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හැකිවන පරිදි කටයුතු කළ යුතු අතරම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් ඛණිජ ආශ්‍රිත ආයතන පිළිබඳ සොයා බැලිය යුතුයි. |
| (ඈ) | රට තුල පැවති යුද්ධය නිසා නිෂ්පාදන කටයුතු නවතා දැමූ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාවේ ඇති ප්‍රයෝජනයට ගත නොහැකි ද්‍රව්‍ය ඉවත් කර කර්මාන්තශාලා පරිශ්‍රය පිරිසිදු කිරීමට අංක අමප/21/0175/320/004 හා 2021 පෙබරවාරි 16 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් තීරණය කර තිබුණි. ඊට සමගාමීව අංක PFD/PMD/01/CM/2021/041 හා 2021 පෙබරවාරි 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, කර්මාන්ත ශාලාවේ සුන්බුන් යකඩ හා ලෝහ පිළිබඳ අයිතම ලැයිස්තු සකස් කර, ඉවත් කළ හැකි ගොඩනැගිලි ආකෘති, යන්ත්‍ර හා සුන්බුන් ලෝහ වල වටිනාකම තීරණය කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පත්කරන ලද කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව පිළියෙළ කර අමාත්‍යාංශය වෙත භාර දී ඇති බව හා . කර්මාන්ත ශාලා පරිශ්‍රය තුළ පවත්නා යන්ත්‍ර සූත්‍ර හා අබලි යකඩ පිළිබඳව සකස් කරන ලද වාර්තාව මෙන්ම ගොඩනැගිලි වලට අදාල ඉංජිනේරු වාර්තාවද ඒ තුළ ඇති බවත්. එහි ටෙන්ඩර් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් ආයතනය නියෝජනය කරමින් නිලධාරියෙකු පත් කර එවන ලෙස රේඛීය අමාත්‍යාංශය මගින් කළ දැනුම් දීම අනුව සභාපතිතුමාගේ නම 2022.04.29 දිනැති අධ්‍යක්ෂ | සංස්ථාව සතු දේපළ ඵලදායි ආයෝජනයන් සඳහා යොදා ගත යුතුයි. |

පත් කිරීමට තීරණය කර තිබුණි. එහෙත් එම කාර්යයන් මේ දක්වා සම්පූර්ණ කර නොතිබුණි. යුද්ධය නිමා කොට වසර 13ක් ගතවී ඇතත් කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කොට සංස්ථාව සතු සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගෙන දේශීය ආර්ථිකයට දායකත්වයක් ලබාදීමට මේ දක්වා සංස්ථාවට නොහැකි වී ඇත.

මණ්ඩලය මගින් අනුමත කර ඇති බව.